

මාකෝ පෝලෝ

සෙයිලාන් (ලංකාව) වල රජතුමා සතුව ලොව විශිෂ්ටතම මැණික තිබූ බවත් එය අතක් තරම් විශාලව කිසිදු පලුද්දක් නොමැති එකක් වූ බවද පෝලෝ සඳහන් කරයි. එය දැල්වෙන ගින්නක් මෙන් අලංකාර බවද කුබ්ලායි ඛාන්ට මේ ගැන දැන ගන්නට ලැබී එරට නගරයක් හා හුවමාරු කරගැනීමට කරන ලද යෝජනාවක් ලංකාවේ රජු විසින් ප්‍රතික්ෂේප කරන ලද වගත් කියා ඇත.

වසය අවුරුදු දහහතක් පිරෙන විට මාර්කෝ පෝලෝ නම් වෙළෙන්දා සිය පියාණන් හා මයිලනුවන් සමග වසර 1271 දී (වසර 735 පෙර) තමන් වාසය කළ වැනීසියේ සිට කැතේ නොහොත් චීනයේ කුබ්ලයි ඛාන් ගේ රාජ සභාව වෙත ගියේය. වසර 24 කට පසු ඔහු ආපසු ගම් බලා පැමිණියේය. මාර්කෝ පෝලෝ මේ දිගු වීර චාරිකාව නිමකොට ආපසු පැමිණ ලෝකයේ විස්තරයක් නමින් පොතක් ලියුවේය. ගමන් විස්තරයක් ඇතැළත් ලෝකයේ පළමු කෘතිය මෙය ලෙසට සලකනු ලැබේ.

මාකෝ පෝලෝ මේ ගමන නිම කිරීමට විඳි දුක්ඛඟැට අපමණ වූ අතර ඇතැම්විට ඔහුගේ විස්තර සුරංගනා කතාවලට සමාන වේ. එක් අවස්ථාවක ඔහු විශාල කුරුල්ලන් විසින් අලින් ඔසවා ගෙන ගොස් අරාබි මුහුදේ හෙළන ලද බවට සඳහන් කර ඇත. මේ නිසා මාර්කෝ පෝලෝ ඇත්තටම මේ ගමන ගියේ දැයි ඇතැම්හු සැක පහළ කළහ. මේ විස්තරය නිසා පෙරදිග රටවල් පිළිබඳ නොරතුරු දැන ගැනීමේ රුචියක් බටහිර වැසියන් තුළ ඇති වූයේය.

වැනීසියේ සිට සිය පියාණන් හා මයිලනුවන් සමග මාර්කෝ පෝලෝ වර්ෂ 1271 දී මේ දීර්ඝ ගමන ආරම්භ කළේය. මෙයට වසර දෙකකට පෙර ඔහුගේම සහෝදරයෝ දෙපළක් චීනයේ කුබ්ලයි ඛාන් රජු හමුවී ආපසු පැමිණ සිටියහ. ඔවුන්ගේ මේ දිගු ගමන කෙළින්ම නොගොස් ජෙරුසලම හරහා යාමට කටයුතු කළේ විශේෂ හේතුවක් නිසාය. එනම් කුබ්ලයි ඛාන් විසින් ඉල්ලා සිටි ජෙරුසලමේ ජේසුස් තුමාගේ සොහොනෙන් ශුද්ධවූ තෙල් බිඳක් ලබාගැනීමටය.

එතැනින් යළිත් ගමන්මගට වැටී ඔවුහු බණ්ඩාස් නම් ස්ථානයට ගියහ. මෙම ස්ථානයේ විශේෂ ගලින්වූ ලැගුම් ගල් තිබූ බව වාර්තා කරයි. මෙම ස්ථානයේදී මංකොල්ලකරුවන් විසින් මහලු අය මරා දමා තරුණ පිරිස් වහලුන් හැටියට ගෙන යනු ලැබූ බව මාර්කෝ සිය කෘතියේ සඳහන් කර ඇත.

හෝර්මස් නගරයට පැමිණෙන පිරිස සිය ගමන් සැළසුම වෙනස්කර ලී හා පොල් ළණුවලින් බැඳ සකස්කර තිබූ බෝට්ටුවල නැගී මුහුද ඔස්සේ ගමන් කිරීමට ඔවුහු අදහස් නොකළහ. මෙසේ කිරීමට ඔවුන්ට සිදුවූයේ මුහුදෙන් එන දැඩි වියළි සුළං නිසා ආශ්වාස ප්‍රශ්වාස කිරීමට තරම් අපහසු තත්ත්වයක් ඇතිකරන බවත් ඇතැම්විට මරණය පවා සිදුවීමට ඉඩ තිබූ නිසා මෙලෙස ගොඩින් යාමට තීරණය කළහ.

හෝමස් සිට ඉන්දියාවේ උතුරු සීමාව දිගේ කෝබියම් හරහා යනවිට ඔවුන් ජලය අතිශයින් සුරක්ෂිතව පරිභෝජනය කළේ එක බිඳුවකුදු අපතේ නොයන ලෙසටය. පාමීර් කඳුවැටියේදී අමුතු ස්වරූපයක ඇං ඇති බැටළු වර්ගයක් ඔවුන්ට හමුවී ඇත. මෙම බැටළුවන්ගේ ඇං මුලින් විශාලව පසුව අලංකාර හැඩයකට පිහිටා ඇත. එම බැටළුවන්ට මාර්කෝපෝලෝ බැටළුවන් යයි නම් තබන ලදී. මෙම බැටළු වර්ගය අතිශයින් මිල අධික වන අතර දැන් වඳවී ගෙන යයි)

ජේන් නම් ස්ථානයට ළඟා වූ පිරිසට තක්ලමාකන් කාන්තාරය හමුවිණ. මේ ප්‍රදේශයේ විවාහක පුරුෂයෙක් බිරිඳගෙන් දින 20 ක් වෙන්වී ඈත පෙදෙසකට ගියහොත් බිරිඳට වෙනත් විවාහයක් කරගැනීමේ අයිතියක් තිබූ බවට චාරිත්‍රයක් පැවැති බව මාර්කෝ පෝලෝ සඳහන් කරයි.



මාකෝ පොලෝ ගේ ගමන් මග

කුබ්ලයි ඛාන්ගේ රාජ්‍යය වන ෂන්ඩු වෙත ළඟාවීමට මාර්කෝ පෝලෝ ඇතුළු පිරිස වසර තුනක් හා මාස හයක් ගතකොට ඇති අතර ගමන් කළ දුර සැතපුම් දොළොස් දහසක් බව කියනු ලැබේ. මේ වනවිට මාර්කෝ වයස අවුරුදු 21ට ළඟාවී සිටියේය. මේ අවස්ථාවේ කුබ්ලායි ඛාන්ට සුදු අශ්වයින් දස දහසක්ද උකුස්සන් 200ක්ද සිටිබව වාර්තාවේ. දඩයම් කිරම සඳහා උපයෝගිකර ගැනීමට කොටි පැටවුන්ද සිටියහ. ෂැන්ඩු ප්‍රදේශයේ තිබුණේ කුබ්ලායි ඛාන්ගේ ගිම්හාන මාළිගයයි. ඔහුගේ නව අගනුවර වූයේ බීජින්ය. මෙම නගරය අතෂලංකාර වීදි හා ගොඩනැගිලිවලින් සැදුන අතර ගණිකාවන් 20000 ක් පමණ නගරයේ සිටි වග මාර්කෝ පෝලෝ වාර්තා කරයි.

කුබ්ලායි ඛාන් ගේ ඛාන් අධිරාජයේ සිටින කාලයේ මොවුහු රජුගේ කටයුතුවලට සහාය වූහ. වසර 1292 දී (අවුරුදු 21ට පසු) ඔවුන්ට ආපසු තම රට බලා යාමට අවසර දෙන ලද්දේ කොන්දේසියක් මතය. පර්සියාවේ සිටි සිය බෑණනු වන් කෙනෙක් වෙත ඔහුගේ පෙම්වතිය වන මොගල් කුමාරිකාවක් කැඳවායාමේ පොරොන්දුව මත ඔවුනට ආපසුයාමට අවසරදීමට ඛාන් එකඟවිය.

ඔවුහු සෙයිතුන් වරායෙන් පිටත්වූයේ නැව් 14 ක් හා සේවකයින් 600 කැටුවය. ඔවුහු වසර කීපයකට පසු පර්සියාවට ළඟාවනවිට මෙම පෙම්වත් කුමාරයා මිය ගොස් සිටියේය. ඔවුහු දකුණු දිගට යාත්‍රාකොට සිංගප්පුරුව මලක්කා සමුද්‍රසන්ධිය ඔස්සේ පැමිණියහ. සිංගප්පුරුව මුහුදු කොල්ලකරුවන්ගේ රජ දහන බවට පත්ව තිබූ බව මාර්කෝ වාර්තා කරයි.

අධික මෝසම් වැසි කුණාටු නිසා මෙම නැව් කණ්ඩායමට සුමාත්‍රා දූපතේ තුන්වසක් රැඳී සිටීමට සිදුවී ඇත. මෙහිදී පොල් වතුර වලට පෙම්බැඳගත් මාර්කෝ එය අතිශයින්ම රසවත් බීමක් ලෙස හඳුන්වයි. පොල් මත්පැන්, වයින් වලට වඩා යහපත් යැයි හෙතෙම කියා ඇත.

මාර්කෝ පෝලෝ ඉන්දියාවේ දකුණු වෙරළ දිගේ ගොස් ඇති නමුත් ලංකාවට පැමිණි වගට සටහන් කර නැත. එහෙත් සෙයිලාන් (ලංකාව) වල රජතුමා සතුව ලොව විශිෂ්ටතම මැණික තිබූ බවත් එය අතක් තරම් විශාලව කිසිදු පලුද්දක් නොමැති එකක් වූ බවද පෝලෝ සඳහන් කරයි. එය දැල්වෙන ගින්නක් මෙන් අලංකාර බවද කුබ්ලායි ඛාන්ට මේ ගැන දැන ගන්නට ලැබී එරට නගරයක් හා හුවමාරු කරගැනීමට කරන ලද යෝජනාවක් ලංකාවේ රජු විසින් ප්‍රතික්ෂේප කරන ලද වගත් කියා ඇත.

ඉන්දියාවේ ගුජරාටි දේශයට ළඟාවන පිරිසට වඩා ගුජරාටි හා මුහුදු කොල්ලකරුවන් බෙහෙවින් කපටිකමින් ඉහළ බවට පෙනී යන්නේ ඔවුන්ට අසුවන පුද්ගලයින්ට ලුණු දියර පොවා කිසියම් මැණික් හෝ වටිනා යමක් ගිලදමා තිබුණහොත් විරේක කර ඒ බව පරීක්ෂාකරන නිසා බව සඳහන් කර ඇත.

මාර්කෝ පෝලෝ දවසද බැග්ඩඩ් යටත් ප්‍රදේශයක් විය. බොහෝ විෂයයන් ගැන මෙහිදී උගත හැකි බව කියා ඇත.

අවුරුදු 24 කට පසු 1296 දී මාර්කෝ පෝලෝ සිය රටට පැමිණිවිට ඔහුගේ හිතවතුන්ට අදහාගත නොහැකි විය. ඔවුන් මියයන්නට අතැයි හැමෝම විශ්වාස කළහ. ඔවුහු සිය කබා ගලවා කුබ්ලායි ඛාන් රජු තමන්ට ත්‍යාග කරන ලද රන් රිදී ආදිය මිනිසුන්ට ප්‍රදර්ශනය කර පෙන්වූහ.

මාර්කෝ පෝලෝගේ ලෝකය පිළිබඳ විස්තරයක් නම්වූ දේශමාන ගමන් විස්තරය සත්‍යයෙන් සිදුවුවක්ද නැද්ද යන්න ගැන විවිධ මත ඇත. කෙසේ නමුදු මෙම ගමන් විස්තර ඇතැළත් පොත එම ගණයේ ප්‍රථම පොත වේ. අද කියවෙන්නකුට එහි කියවීමේ රසයක් ඇති නොකරයි. මාර්කෝ පෝලෝගේ මෙම පොතේ පිටපත් 14 වැනි 15 වැනි සියවසට අයත් පොත් සියයක් පමණ ඇති වගත් ඒ සියල්ලම වාගේ ක්‍රිස්තියානි ආයතන විසින් සංස්කරණයට භාජනය කරන ලද බව වාර්තාවේ. ක්‍රිස්ටෝපර් කොලම්බස්, බර්තොලමියුදියෙස්, වස්කෝද ගාමා, වැනියවුන් මෙය පරිශීලනය කරන්නට ඇතැයි සිතනු ලැබේ.

සෑම සෙනසුරාදාම දහවල් මෙල්බන් වේලාවෙන්
1 සිට 5 දක්වා එෆ් එම් 97.4 ඔස්සේ
තිසර
www.thisara.com

රංජිත් රූවි සමඟ පැය තුනක්
ධර්මෝදය සහ
නැඩුම් ගීත සමයින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

නාදවුණ සුවඳ සරවන් සාරා ඔබා
ලෙස් එදෙස් කාලීන සිද්ධීන් ඕසුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

දඟයා සහ මුත්තගෙ විත්ති

කුසුම්සිරි ලියනආරච්චි සහ යශෝධරා සරච්චන්ද්‍ර විසින් ආරම්භ කරන ලද ළමා නාට්‍ය වැඩමුළුවේ ප්‍රථම නිෂ්පාදනය **2008 මාර්තු 08 වන සෙනසුරාදා වේදිකාගත වෙයි. සවස 2 ට සහ 6 ට** වශයෙන් දර්ශන වාර දෙකකි.

මෙල්බර්න් වල නොයෙක් මාදිලියේ නාට්‍ය නිර්මාණ රඟ දැක්වෙනව. ඒවයෙන් සියයට අනූනමයක්ම පාහේ වැඩිහිටියන් සහභාගි වෙන වැඩිහිටියන් උදෙසා බිහිවෙන නිර්මාණ. දඟයා සහ මුත්තගෙ විත්ති නාට්‍යද්වයේ විශේෂත්වය තමයි ළමුන් සහ වැඩිහිටියන් විසින් මූලිකවම ළමුන් උදෙසා කෙරෙන නාට්‍ය දෙකක් වීම. මූලිකවම ළමුන් උදෙසා උනත් වැඩිහිටියන්ටත් එකසේ රස වඳින්න පුළුවන් නාට්‍ය දෙකක්. සිංහල ජන රංග ශෛලීන්, සංගීතය, නර්ථනය මිශ්‍රිතව නිර්මාණය කෙරෙන දඟයා සහ මුත්තගෙ විත්ති මෙල්බර්න් සිටින අපේ ළමුනට නව්‍ය වූ නාට්‍ය අත්දැකීමක් වෙනු නොඅනුමානයි.

දඟයා සහ මුත්තගෙ විත්ති රංගනයෙන් පෝෂණය කරවන අපේ ළමාකැළ මෙසේයි... හසිනි ඉලංගරත්න, වසුන්ධරා ඕපනායක, තිලිනි රණසිංහ, මංජිත විජේසිංහ, හසිනි වල්පොල, දිලිෂා වල්පොල, නෙවින් වල්පොල, නෙත්මා මල්ලව, ලක්ෂාන් වල්පොල, ජනනි සේනාරත්න, නිර්මාණි සේනාරත්න, මධුර බණ්ඩාර, සම්මානි සේනාරත්න, මනිෂා ගමගේ, හසිත බණ්ඩාර, කසුනි පාදුක්කගේ, සිදත් බණ්නැහැක, දෙව්ම බණ්නැහැක, තිෂාරා කත්රිආරච්චිගේ, සෂික දොඩවත්ත, විනුකි මල්ලව, දිලිගි ජයසිංහ, සමිත් ජයසිංහ. ළමුනට දැනිරිය දෙමින් ඊට රංගනයෙන් දායකවන වැඩිහිටි කැළ අපිත් ද සිල්වා, දිලිගි වල්පොල, වසන්ත මුතුමාල, ලක්ෂ්මන් ගමගේ.

කුසුම්සිරිගේ පිටපත් වර්ණවත් කරමින් යශෝධරා නිර්මිත සංගීත තනු වලට පණ පොවමින් සංගීතය මෙහෙයවනුයේ රොහාන් නෙත්සිංහ විසින්. සහභාගිවන වාදක මඩුල්ලෙන් වැඩිපිරිසක් රොහාන් යටතේ සංගීතය හඳාරන අපේම දරු දැරියන් වීමත් මෙහි විශේෂිත කරුණක්.

මෙල්බර්න් වෙසෙන ඔබේ දරුදැරියනට සුන්දර වූ සිංහල නාට්‍ය අත්දැකීමකට දඟයා සහ මුත්තගෙ විත්ති නාට්‍ය කැළෙන් ඔබට කෙරෙන සොදුරු ඇරයුමයි මේ...